# හම්බන්තොට ආශ්‍රිත ඓතිහාසික පුරාවිද්‍යාව පිළිබඳ විමසුමක්

වයි. කේ. තිස්ස බණ්ඩාර

ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළ කලාපයට අයත් ශුෂ්ක කලාපීය දේශගුණික රටාවක් ඇති හම්බන්තොට දිගු ඉතිහාසයකට හිමිකම් කියාපාන ප්‍රදේශයකි. එම දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය වන හම්බන්තොට නගරය මෑතකාලීනව විවිධ අංශ හරහා සංවර්ධනයට ලක්වෙමින් පවතී. ස්ථානීය නාමයෙන් ස්වභාවය පිළිබඳව සිතා බැලීමේදී පෙනීයන්නේ, තොටුපොළක් හා එහි ගොඩබට යාත්‍රා විශේෂයක් පදනම් ව ඇති බවය. මේ පිළිබඳව මතුවට විස්තර වේ. අතීතයේ සිටම මෙහි වෙරළ තීරුව හා සම්බන්ධව තොටුපොල කීපයක්ම පැවති බව සමහර මූලාශ්‍රයන්හි සඳහන්වේ. වළවේ ගඟ මුහුදට වැටුණු පැරණි ස්ථානයේ තොටමුණක් පැවති බව ගොඩවාය පුරාවිද්‍යා ස්ථානයෙන් හෙළිවෙයි. මෙහි පැවති තොටුපළින් ලත් ආදායමින් කිසියම් ප්‍රමාණයක් බදු වශයෙන් ගොඩ පබබත විහාරයට දිය යුතුබව කියැවෙන සටහනක් ගොඩවාය සෙල්ලිපියෙන් කියවේ **(Paranavitana 1983, 101)**. මෙය ක්‍රි. ව. දෙවන සියවසේදී ගජබාහු රජු විසින් කරන ලද නියමයක් බව පිළිගෙන තිබේ. එම ලිපියේ ගොඩපවත පටන යන්න සඳහන්ව තිබීමෙන් මෙහි පටුනක් තිබූ බව පිළිගැනීමට පුළුවන. මේ ආශ්‍රිත ස්ථානයකින් රෝම කාසි තිස්දාහක් මෑතකදී ලැබී ඇත (බෝපේආරච්චි 1994). මෙම කරුණ පැරණි විදේශ වාණිජ සම්බන්ධතා හෙළි කරවන්නකි. භූභෞතික විපර්යාස හේතුවෙන් පැරණි ගංගා මෝය හා තොටමුණ වෙනස් වී ඇතිබවක් වර්තමානයේදී පෙන්නුම් කෙරේ. එහෙත් මීට සැතපුම් කිහිපයක් දුරින් හම්බන්තොට නගරය ආසන්නයේ තොටුපළක් (වරායක්) කාලාන්තරයක් තිස්සේ ප්‍රයෝජනයට ගන්නා බව දක්නට පුළුවන.

"හම්බන්" නැමති ජලයාත්‍රා විශේෂයක් මෙහි ගොඩබට හෙයින් එම තොට උක්ත නමින් ව්‍යවහාර වන්නට ඇති බව පොදු පිළිගැනීමය. "හම්බන්" නැමති ජලයාත්‍රා පිළිබඳ සාහිත්‍යය මූලාශ්‍රයන්හි හා වෙනත් වාර්තාවල සඳහන් වේ. මහනුවර සමයේ ලියවී යැයි සැලකෙන මන්දරම්පුර පුවතේ (මන්දාරම් පුවත 1996, 76) සම්බාන යන වචනය යෙදී ඇත. එම පුවතේ කියැවෙන ආකාරයට ත්‍රිකුණාමලයට ද මේ යාත්‍රා විශේෂය පැමිණ ඇත. හම්බන් යන්න චීන භාෂාවෙන් කියැවෙන "ෂම්පාන්" යන්නෙන් සෑදුනකැයි කියවේ. සොළී දේශයේ සිට කුමරකු ලංකාවට පැමිණීම පිළිබඳව විස්තර කියැවෙන දොළහ දෙවියන්ගේ කවි පෙළක සම්බානක් සම්බානෙත් බැඳී (හොල්ට් 1994, 184) යන යෙදුම්වලින් කියවෙන්නේද මේ යාත්‍රාම දැයි සිතා බැලීම වටී. එම කවියේ අවසන් පදයේ සොළී රජ නැව පිට වඩින ඉනත්ගු යන්නද ඇති හෙයින් "සම්බාන" යනු කුඩා යාත්‍රා වර්ගයක් බව සිතීමට පුළුවන. නමුත් වචනාර්ථය ගත් විට කිසියම් සම්බන්ධයක් ඇති බව පැහැදිලි වේ. එසේ වූවත් නිතම් කලක සිට මෙම නාමය උක්ත ස්ථානයකට සම්බන්ධ වූයේද කිව නොහැකිය. කාලීන උපයෝගීතාවය අනුව මෙහි වැදගත්කම වෙනස් වන්නට ඇතැයි සිතීමටද කරුණු තිබේ.

ඉංග්‍රීසි පාලන සමයේදී මෙම තොටුපල කාර්යය බහුල වරායක් ලෙසින් පැවති බවට සාධක තිබේ. එක් වසරක් තුළදී මෙහි නැව් 105 ක් පැමිණ ඇත. අපනයන භාණ්ඩ වලින් ප්‍රධානතම ද්‍රව්‍ය වූයේ කෝපිය. මෙයට අමතරව කපු හා මුවඅං ද විය. දිවයිනේ ගොඩබිම් මාර්ගවලින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ මෙම ස්ථානයේදී නැව් ගත කරන ලදී. විශාල ප්‍රමාණයේ නැව් ගොඩබිම ආසන්නයට ඒමට නොහැකි නිසා කුඩා බෝට්ටු දෙකක් මිලට ගෙන සේවයේ යෙදවිය. මෙම වාර්තාව අනුව පෙනී යන්නේ එතරම් විශාල නොවූ යාත්‍රා පමණක් මෙහි පැමිණි බවයි. මෙම කාලසීමාවේදී උක්ත ප්‍රදේශය හා සම්බන්ධ කෙරෙමින් මංමාවත් කිහිපයක්ම ඉදිවන්නට ඇත්තේද, මෙම වරායේ ඇති වැදගත්කම අනුව විය යුතුය.

මේ ආකාරයට තොටුපලේ සම්බන්ධය මත ඇතිවූයේ යැයි සිතනු ලබන නගරය ඓතිහාසික අතින් දිගු කාල පරිච්ඡේදයකට අයත් වේ. මෙකී කලාපයේ පුරාණ රෝහණ රාජධානිය ඓතිහාසික සිදුවීම්වලට පසුබිම් වූ භෞමික ක්ෂෙත්‍රයක් බව පෙනේ. පුරාතන රෝහණය කලින් කලට සීමාවන් වෙනස් වූ පාලන ඒකකයක් බව පිළිගැනේ. අනුරාධපුරය හා පොළොන්නරුව රාජධානි සමයේදී රෝහණය තුල ඓතිහාසික වශයෙන් වැදගත් වන සිදුවීම් රාශියක්ම මහාවංසය හා චූලවංසය ආදී මූලාශ්‍රයන්හි සඳහන් වේ. මෙම රාජධානිය පැවති ස්ථාවරත්වය නිසා පාලකයින් කිහිප දෙනෙකුටම සමාජ දේශපාලනික ආර්ථික සහ ආගමික යන අංශ තුළින් බොහෝ වැදගත්ව ඇතිබව පෙනීයයි. වර්තමාන හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ විවිධ කාලසීමාවන්ට අයත් සංස්කෘතික දේපල පිහිටා තිබේ. එම දේපල පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති චංචල හා නිශ්චල සංස්කෘතික සාධක ලෙසින් දෙයාකාර වේ.

ඉතිහාසයට මූලාශ්‍ර සපයන්නාවූ අභිලේඛන ප්‍රමාණයන්ද මෙකී කලාපය සතුවීම පුරාතන සමාජ ආර්ථික රටාවේ බොහෝ තොරතුරු දැනගැනීමට උපකාරීවනු ඇත. නාණකවිද්‍යා මූලාශ්‍රයන් වින පැරණි කාසි හා මුද්‍රා මෙකී කලාපයෙන් වාර්තාවීමක්ද දක්නා ලැබේ. එම කාසි දේශීය මෙන්ම විදේශිය වශයෙන් කොටස් දෙකකට වෙන්වේ. රුහුණින් හමුවන්නා වූ පැරණි කාසි අතර පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත නම් යෙදූ කාසි ප්‍රමාණයක් අකුරුගොඩින් වාර්තාවේ (Jayasinghe, 1996). දිවයිනේ ප්‍රථමවතාවට හඳුනාගත් මෙම කාසි කීපයෙන් රුහුණේ ඉතිහාසයට නව ආලෝකයක් ලැබිණැයි කීමට පුළුවන. එම සොයාගැනීම අනුව ක්‍රි. පූ. දෙවන සියවසට පෙර සිට නම් යොදා කාසි නිකුත්කළ සහ පරිහරණය කළ පිරිසක් පුරාණ රුහුණේ සිටි බව පෙනී යයි. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් අකුරුගොඩින් කාසි නිපදවීමට භාවිතාකළ ඉපැරණි මුද්‍රා සහ අච්චු කීපයක් හඳුනා ගෙන තිබේ (බොපේආරච්චි සහ වික්‍රමසිංහ, 1997). තිස්සමහාරාම වැව ඉවුර සේදී යෑමෙන් මතු වූ මැටි බඳුන් කැබලි දහස් ගණනකින් කීපයක බ්‍රාහ්මී ලේඛන සටහන්ව තිබුණි. මේවා ක්‍රිස්තු පූර්ව සමයට අයත් වේ. එක් පාත්‍රතැටියක පුද්ගල නාමයක් විය. එය "ගපතිසිව" යන්නයි. තවත් අසම්පූර්ණ බඳුන් කැබැල්ලක "........ක දයපුසහ අබ" යන්න සටහන්ව තිබිණි. මෙහි මුලින් අඩු අකුරු ගම් හෝ බොජි යන ඒවා විය යුතුය. එසේ අඩු කොටස නිවැරදි නම් ගමික හෝ බොජික යන වචනය පුද්ගලනාමයට මුලින් යෙදී ඇත (Parker 1984, 462). මෙම කියමනට අනුව පෙනී යන්නේ, ශිලා ලේඛනවලට අමතරව පූර්ව බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියූ වෙනත් සටහන්ද පැවති බවය. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබෙන පැරණි සෙල්ලිපි පරිශීලනය කිරීමෙන් පැරණි යුගයේ සමාජ ආර්ථික රටාව පිළිබඳ යම් අදහසක් ලබා ගැනීමට පුළුවන. එමෙන්ම පැහැදිලි කාලනිර්ණයක් ලබා ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව මෙම ලේඛන ආශ්‍රයෙන් වැඩි හෙයින් ඒවා කලාපය සතු අගනා ඓතිහාසික මූලාශ්‍ර සේ සැලකීම වටී. විශේෂයෙන් ම හම්බන්තොට දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්තව ඇති පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනගත තොරතුරු අනුව කුමන ආකාරයක සමාජ තත්වයක් කාලීන වශයෙන් පැවතියේ ද යන්න තේරුම් ගැනීමට පුළුවන. එම ලේඛන ක්‍රි. පූ. තෙවැනි හා දෙවැනි සියවස්වලට අයත් ඒවා සේ සැලකේ. මේ ලිපි 150 ක් පමණ ප්‍රමාණයක් අතරින් පුද්ගල නාම හා ඒවා අගට එක්කර ඇති විශේෂණ නාම ඇතැම් අයගේ තරාතිරම හෙළි කරයි. මේ අය අතර යුධ සෙනවියන් (සෙනපති), ආදායම් ගණන් තැබූ නිලධාරීන් (අයක), භාණ්ඩාගාරිකයන් (බඩගරික), වෙළෙන්දන් (වාණිජ), ස්වර්ණකාර්මිකයින් (තලදර), කර්මාන්ත හෝ විශේෂ ශ්‍රේණි නායකයින් (අවරිය), සන්නාලියන් (තතවය), වඩු කාර්මිකයින් (වඩක), අසරුවෝ (අසරු), වෙළඳ මූලස්ථාන නායකයින් (පුගියන) යන අය සිටිති (Paranavitana 1970, 620, 647, 703, 619, 657). ඝණක යන නාමය සඳහන් අයෙකු දේවානම්පියතිස්ස රජුගේ කාර්යය මණ්ඩලයේ ද සිටියේය (වංශත්, 11: 26;). ඒ අතර සෙට්ටි (සිටුවරයකු) ද දක්නා ලැබේ (එම). දේවානම්පියතිස්ස රජුගේ ගණකවරයා රත්මිණි මුතු භාරව දඹදිව යැවූ අයෙකි (ම.ව. 11, 20). හම්බන්තොට දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන අතරින් කීපයක විශේෂ පුද්ගල නාම අන්තර් ගත වේ. මේ අතර ගමික, පරුමක, බත, ගහපති යන නාම දක්නා ලැබේ (Paranavitana 1970, 576, 578, 594, 582).

මේවාට අමතරව මෙම ලිපි තුළ සටහන්ව ඇති අක්ෂර නොවන සංකේත විශේෂ අධ්‍යයනයකට ලක් කළ යුතුවේ. භික්ෂූන් වහන්සේට ලෙන් පිදීම කළ පුද්ගලයින් ගේ නම් සහ තරාතිරම පමණක් නොව ඇතැම් ඒවායේ අක්ෂර නොවන සලකුණු යෙදීමේ අරුත කුමක්දැයි යන්න නිශ්චිතවම කිවනොහැකිවුවත් ඒවායින් ඉන් ඔවුනගේ විශේෂ අනන්‍යතාවය නියෝජනය වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ ආකාර සංකේත සහිත ලෙන්ලිපි වාර්තාවේ (එම, 556-558, 561,563, 566,567,569). මේ ලිපි 13 ක ඇති සංකේත අතර මත්ස්‍ය සලකුණු සහ වේදිය සහිත ස්වස්තිකය දක්නා ලැබේ. දිවයින තුළින් දැනට වාර්තා වී ඇති මේ ලක්ෂණ සහිත ලෙන් ලිපිවලින් වැඩිම ප්‍රමාණයක් අයත් වන්නේ මෙකී දිස්ත්‍රික්කයේ ඇති ලිපි වලටය. උක්ත ලෙන් ලිපි ව්‍යාප්තව පවතින ප්‍රදේශ බෙහෝමයක් ම දැනට වනාන්තර වශයෙන් දක්නට ලැබුණත්, කාලීන වශයෙන් ජන ව්‍යාප්තියක් පවතින්නට ඇත. දැනට හඳුනාගෙන ඇති ආකාර අනුව දිවයිනේ වෙනත් ස්ථාන කිහිපයකම ඇති මහාශිලා (මෙගලිතික) සුසාන සංකීර්ණයක් ද පසුගිය වසරේදී අම්බලන්තොට ප්‍රදේශයෙන් වාර්තා විය. මෙය මහපැලැස්ස ආශ්‍රිත වනය තුල පිහිටා ඇත. සාමාන්‍යයෙන් මෙම සුසාන සංස්කෘතිය ක්‍රි. පූ. හත්වන හා තුන්වන සියවස්වල දී ලංකාව තුළ පැවති බවට කාල නිර්ණ සාක්ෂි ලැබී ඇත. නමුත් මුලින් සඳහන් කළ සුසාන සංකීර්ණය පිළිබඳ ව මෙතෙක් පර්යේෂණ පවත්වා නොමැති හෙයින් නිශ්චිත කාලසීමාවක් පැවසිය නොහැකිය. එම සුසාන ස්මාරකවල ව්‍යුහ ගත ලක්ෂණ අනුව ඉතා පැරණි බව පැවසීමට පුළුවන. මහපැලැස්සේ දක්නට ලැබෙන පුරාණ යැයි සැලකිය හැකි සුසාන ස්මාරක මතුපිට ඇති ඒවා මෑතකාලීන මානව ක්‍රියාකාරකම් නිසා විනාශයට පත්ව ඇති අයුරු ස්ථානය පරීක්ෂා කිරීමේදී පැහැදිලි විය. දිවයිනේ මහාශිලා සුසාන ස්ථානගත ව ඇති ප්‍රදේශ ආශ්‍රිතව පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන ද දක්නට ඇත (Senavirathne 1984, 287). මෙම කියමන සනාථ කරවන සාධක මහපැලැස්ස ආශ්‍රිතව ද පවතී. එනම් එම සුසානවලට තරමක් දුරින් කරඹගල පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි සහිත කටාරම් කෙටු ගුහා කීපයක්ම දක්නට ඇත.

හම්බන්තොට ප්‍රදේශයේ පුරාවිද්‍යා පර්යේෂණ මගින් මෑතකාලීන සොයාගැනීම් කීපයක්ද වාර්තා විය. ඒවා අතරින් අම්බලන්තොට රිදියගම එක් ස්ථානයකි. මෙම ස්ථානයෙන් පුරාණ සමයට අයත් යකඩ උණු කිරීම ඇතුළු ලෝහ තාක්ෂණයත්, වීදුරු, පබළු නිෂ්පාදන ක්‍රියාවලියත් සිදුකළ බව කියාපාන සාධක හඳුනාගෙන තිබේ (Bopearachchi 1997). පැරණි ලෝහ තාක්ෂණය හා සම්බන්ධ උඳුන් කීපයක් ම ඇතිබව මේ අනුව පෙනී යයි. ඒවා විවිධ හැඩ සහ විවිධ ප්‍රමාණවලින් යුක්තවන බවත් උපයෝගිතාවය අනුව සිද්ධි කීපයක් සඳහා ම පරිහරණය කර ඇති බවත් කියවේ. වීදුරු හා පබළු නිපදවූ සාධක මෙහි පවතින බව සොයාගැනීම, අම්බලන්තොට හා රිදියගම ආශ්‍රිත කලාපයේ ඓතිහාසික තොරතුරු දෙස හැරී බැලීමට පාදක වූයේය.

රිදියගම ආසන්නම නගරය අම්බලන්තොට නගරයෙහි ද ඓතිහාසික වැදගත් කමක් ඇති බවක් පෙනේ. ස්ථානීය නාමෙහි සම්භවයට අම්බලන් හා තොටක් සම්බන්ධ ව ඇත. මෙහි අම්බලන් හා තොටක් පැවති හෙයින් අම්බලන්තොට වී යයි කියයි. සාමාන්‍යයෙන් අම්බලන් ඉදිවන්නේ ගමන් මාර්ගයන් අසබඩය. අම්බලන්තොට යන්න සාමාන්‍යයෙන් දිවයින තුළ පිහිටි ගංගා තොටමුණක් ලෙස සැලකීම යුක්ති සහගත යැයි සිතේ. වර්තමාන මෙම නගරය මධ්‍යකාලීන යුගයේදී මනාවුළු පුරය ලෙසින් භාවිතා වූ පුරාණ මහානාගහුල බව විල්හෙම් ගෛගර් හඳුනාගෙන තිබේ (ආරියපාල 1962, 105). මෙම හඳුනාගැනීම නිවැරදි නම් ඓතිහාසික තොරතුරු බෙහොමයක්ම අම්බලන්තොටට සම්බන්ධ වේ. එනම් රෝහණයේ මාගම් පුරයට අමතරව කාලීන වශයෙන් පැවති තවත් නගරයක් ලෙස මෙය හැඳින්විය හැකිය. මෙම නගර දෙකෙහි කිසියම් ඓතිහාසික තත්වයක් යටපත්ව ඇතැයි පෙනේ. එනම් මාගම් පුරය කේන්ද්‍ර කරගනිමින් අනුරපුර සමයේ දී ඇතැම් අවස්ථාවල දී සමහර පාලකයින් යුධ කටයුතු සංවිධාන කළාක් මෙන් පොලොන්නරු සමයේ දී මහානාගහුල කේන්ද්‍ර කර ගනිමින් මහා විජයබාහු යුධ කටයුතු සංවිධාන කළ බව හෙළිවෙයි (ම.ව. 56, 36). එපමණක් නොව මහා විජයබාහු රජ මහානාහුලයෙහි රාජධනිය පවත්වා ගෙනගිය බවද කියැවේ (ම.ව. 58; 90). මහපරාක්‍රමබාහු රජු රුහුණේ රජුන්ගේ රාජධානියක් වූ මහනාගහුල ආක්‍රමණය කළේය (එම). අනුරධපුර හා පොලොන්රුව රාජධානි සමයන්ට අයත් සේ සැලකෙන පුරාවස්තු සහ ස්මාරක මෙම ප්‍රදේශයේ සුලබය. ඒවාට අනුව එකී කාලසීමාවන්හි දී සමස්ථ කලාප රාජධානියේ පසුබිමට අයත් වන්නට ඇතැයි යන්න පොදු පිළිගැනීමයි. මෙම කරුණු සනාත කිරීමට සාහිත්‍ය මූලාශ්‍රයන් ද දිවයින සතුව පවතී. උක්ත කාලසීමාවන්හිදී මෙම ප්‍රදේශ ආර්ථික දේශපාලනික හා ආගමික අංශ කෙරෙහි දියුණුවට පත්ව කාලාන්තරයක් පවතින්නට ඇති බවට සාධක තිබේ. ඓතිහාසික වශයෙන් අගය කළ හැකි සංවර්ධනය සඳහා කලාපීය හා භෞතික තත්වය කිසියම් පදනමක් දමා ඇති බව ප්‍රදේශයේ පිහිටීම අනුව පෙනී යයි. මධ්‍යම කඳුකරයේ සිට දකුණු දෙසට ගලා බසින වළවේ ගඟ මෙම කලාපයේ දක්නට ඇති භෞතික ලක්ෂණ අතුරින් ප්‍රධාන ස්ථානයක් හිමිකර ගනී. වළවේ ගඟ පුළුල් කලාපයක් පෝෂණය කිරීමට බහු සම්පත් ලබාදෙන ස්වාභාවික සම්පතක් සේ අගය කිරීමට වටී.

වලවේ ගඟෙහි සුන්දරත්වය දක්වන මනාවුළු සංදේශ කතුවරයා "වන නදිය රළ" පතරින් හා පක්ෂින් ගෙන් ගහණ වූ බව දක්වයි (මා.නා. 3;). මනාවුළු පුරයේ සිට බුරුම රටට සංදේශයක් යැවූ සිද්ධිය ක්‍රි. ව. 12 වන සියවසේ සිදු වූවෙකැයි කියවේ. මෙම සංදේශය ආරම්භ කළ ස්ථානය ලෙස සැලකෙන රම්බා විහාරය දැනට ද පවතී. එකී සංදේශයට අනුව නගරයේ දියුණුබව, උසස් කුල ඇති ජනයා, සතුරන්ට ලංවිය නොහැකි බලකොටුවක් බව, මල්පල සහිත ගස්වැල් ඇති බව යන තොරතුරු රාශියක් ගැන කියැවේ. වලවේ ගඟෙහි මුල් නාමය "වන නදිය" බව මෙයින් පැහැදිලි වේ. වනය යන්නට "වළ" යන්න යෙදීම පැරණි සිංහල සාහිත්‍යය අනුව ද හෙළිවේ. කොට්ටේ රාජධානි සමයේ ඇතැම් තොරතුරු දක්වන ක්වේරෝස්, සමනල කන්දෙන් ගලා බසින වලවේ ගඟ ගව් විස්සකින් මුහුදට ගලා වැටෙන බවත්, ගඟෙහි යාත්‍රා නොකළ හැකි බවත් දක්වයි (පොත්තම්පෙරුම 1962, II). වලවේ ගඟෙහි ඉහල නිම්නයේ දැනට නටබුන්ව ඇති වැව් බොහොමයක්ම එකිනෙකට සම්බන්ධවූ ජල මාර්ග පද්ධතියකින් සමන්විතව වලවේ ගඟින් පෝෂණය ලබන්නට ඇති බව සිතීමට පුළුවන. අදළ කලාපයේ අගලේ සිතියමින් මේ බව වඩාත් ප්‍රකට වේ. මෙම වැව්වලින් බොහොමයක් අනුරාධපුර හා පොළොන්නරුව සමයන්ට අයත්යැයි සැලකීමට ඉඩ ඇත. වලවේ ගඟෙහි පහළ නිම්නයේ තිබූ සමහර වැව් මෑත කාලීන වාරි කර්මාන්තයේ සංවර්ධන කටයුතුවලට යටත් ව ඇත. මේ අතරින් මුලින්ම දක්වා ඇති රිදියගම විශේෂත්වයක් දක්වනු ඇත (බ්‍රොහියර 1959, 19). 1930 දශකයේ ඉදි කරන ලද වර්තමාන රිදියගම වැවට පුරාණ වැව් හතක් යටව ඇති බවත් ඒවා කුඩා ප්‍රමාණයේ වැව් යැයි ද ජනප්‍රවාදයේ පවතී. නව රිදියගම වැවට යටව ඇති භෞතික ක්ෂෙත්‍රයේ පුරාණ නටඹුන් බහුලව ඇති බව පෙනීයයි. සරලව ගත්කල පැරණි ජනාවාස රටාවක තොරතුරු මේ ආශ්‍රිතව පවතී. නව වාරි කටයුතු සිදු කළ සමයේදී මෙම කලාපය පිළිබඳව පුරාවිද්‍යා ගවේෂණයක් සිදු වුයේ නම් ජලයට යටත් වූ ඉඩම් වලින් බොහෝ දත්ත ලබා ගැනීමටත් ඒ අනුව පුරාවිද්‍යා අර්ථකථනයක් ඉදිරිපත් කිරීමටත් තිබුණ අවස්ථාව මගහැරී ඇත.

වර්තමාන රිදියගම වැවෙහි ජලය අඩු වන විට එහි ඉවුරු කීපයකින් බොහෝ පුරා වස්තු මතුවෙමින් පවතී. කලාන්තරයක් තිස්සේ ඉවුරු සේදීයාම තුළින් සහ වැව් පතුළේ ගොඩබිමට ආසන්න කොටස් සේදී යාමෙන් මෙම පුරාවස්තු මතු වෙමින් පවතී. සමහර ප්‍රදේශවාසීන් මෙම පුරාවස්තු රැස්කිරීමට පෙළඹී සිටිති. ලැබෙන පුරාවස්තු අතර දේශිය හා විදේශිය පැරණි කාසි වර්ග විවිධ අමුද්‍රව්‍යයන්ගෙන් නිමවන ලද පැරණි පබළු, ලෝහ කැබලි, ලෝහ උණුකිරීමට භාවිතා කළ උඳුන් යැයි සිතනු ලබන සාධක, මැටි බඳුන් කැබලි ආදිය බහුලය. ලැබෙන්නා වු පැරණි කාසි සහ පබළු ඒවා අහුලනු ලබන අය ඒවා මිලට විකිණීමට පවා පෙළඹී සිටිති. මේ දෑ බහුලව හමුවන හෙයින් එතරම් අගයක් නැති සෙයක් පෙනෙයි. නමුත් කෞතුක වස්තු ලෙස මේවායෙහි වටිනාකමක් නැත්තේ ම නොවේ. ඒ වුවද ඒවා පිළිබඳව කිසි අර්ථකථනයක් ලබා ගැනීමට තැන්පත්ව පවතින ස්වභාවයක සුදුසු පසුබිමක් නොපෙන්වයි. එනම් මේවා ලැබෙනුයේ වැවට සේදන මට්ටමෙනි. ජලය අඩු වනවිට පෑදෙන බිමෙන් ලැබෙන පුරාවස්තු සඳහා ස්තර අනුසාරයෙන් කිසිදු අදහසක් ලබාගැනීමේ අවස්ථාවක් නොලැබෙනු ඇත. ඒ අනුව මේවා මතුපිට එකතු ලෙස සැලකීම යුක්ති සහගතය. එකී පුරාවස්තුන්ගේ ස්වරූපය කුමන ආකාරයට ද යන්න පමණක් පැහැදිලි කිරීම සුදුසු වේ. මේවා ගැන නිශ්චිත කාලවකවානුවක් පැවසිය නොහැකිවුවත් දිවයිනේ වෙනත් පුරාවිද්‍යා ස්ථානවලින් ලැබී ඇති සහ ලැබෙමින් පවතින ඒවා හා සැසඳීමෙන් ස්වාභාවයෙහි පැරණි බව තේරුම් ගැනීමට පුළුවන. වැව් පිටියෙන් එකතුකරනු ලබන සමහර පැරණි කාසි රෝම කාසිවලට අයත්වේ (Bopearachchi 1996). මෙම ගමෙහි ස්ථානයකින් ලැබී ආචාර්ය බෝපේආරච්චි මහතා වෙත බාරදෙන ලද කාසි කැටයක් එම මහතා විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලීය පුරාවිද්‍යා කෞතුකාගාරයට පරිත්‍යාග කර ඇත. මෙම කාසි කැටය කුඩා මැටි බඳුනකි. බඳුනේ කටට අමතරව බඳෙහි කපා ඇති සිහින් සිදුර කාසි ඇතුළු කිරීමට කැපූ සිදුරක් බව පෙනේ. දැනුදු එම බඳුන තුළ එකට ඇලී ගැලවීම අසීරු කාසි කිහිපයක් දක්නට ඇත. කැටයේ ස්වරූපය අනුව පෙනී යන්නේ බඳුන පොළවේ වළලා සිහින් විවරයෙන් කාසි ඇතුල් කරන්නට ඇති බවය. මෙහි තුළ දැනට ඇති කාසි කිපය පෙනුමෙන් රෝම හෝ අනුකරන රෝම කාසි වලට අයත් වේ යැයි කිව හැකිය. දක්ෂිණ ලංකාවේ බොහෝ ස්ථානවලින් රෝම කාසි ලැබී තිබේ (Weerakkody 1995). හම්බන්තොට දිස්ත්‍රික්කයේ හමුවන රෝම කාසි ප්‍රමාණය, දිවයිනේ රෝම කාසි ලැබෙන අනෙකුත් ස්ථාන අතුරින් ලැබෙන ප්‍රමාණයට හා ස්වරූපවලට වඩා වෙනස් බව පෙනේ.

රිදියගම වැව් පිටියෙන් ලැබී ඇති පබළු පැරණි ඒවා බවත් ඒ අතර විදේශිය අමුද්‍රව්‍යයන් ගෙන් නිමවන ලද පබළු ඇති බවත් හඳුනාගෙන තිබේ (බිත්ති පුවත්පත,ජේ. වි. වි 1996). මෙම ස්ථානයෙන් මතු වන ඉතා පැරණි මැටි බඳුන් කැබලි විවිධ ලක්ෂණ සහිත වේ. මේවා කැබලි වශයෙන් ගණනය කළ නොහැකි ප්‍රමාණයක් වැව් පිටියේ රාශිභූත වී පවතී. එම බඳුන් කැබලි වල ස්වරූපය අනුව පෙනී යන්නේ, අවධි කිහිපයක් ම ඒවායින් නියෝජනය වන බවයි. වැවෙහි වේල්ලේ නැගෙනහිර ඉවුර වැවට සේදීම නිසා, වන බිම්වලින් හා වැව් පතුළෙන් ලැබෙන බඳුන් කැබලි, ස්තර පෙළ ගැසීමකට අනුව අර්ථකථනකට ලක් කළ නොහැකිය. බොහෝ බඳුන් වලට අයත් කැබලි බොහෝ ප්‍රමාණයක් මෙහි අන්තර්ගත ව පවතියි. මේවා අතර කාල රක්ත වර්ණ බඳුන් කැබලි බහුලයි. ප්‍රාථමික යකඩ යුගයේ විශේෂ මැටි බඳුන් කාණ්ඩයක් ලෙස කාල රක්ත වර්ණ මැටි මෙවලම් (BRW) හැඳින්වේ (Senaviratne 1984, 239). කාල රක්ත වර්ණ බඳුන් කැබලි අනුරාධපුර පැරණි ඇතුළු නගරයේ පහල ස්තර තුළින් හඳුනාගෙන ඇත (Deraniyagala 1970, 112). ඒවා පූර්ව සහ මුල ඓතිහාසික යුග නියෝජනය කරන බවද දැරණියගල මහතා අදහස් කරයි. පුත්තලම දිස්ත්‍රික්කයේ පොම්පරිප්පුවේ ඉපැරණි සුසානයෙන් කාල රක්ත වර්ණ මැටි බඳුන් ලැබී තිබේ (Bandara 1997). ඉන්දියාවේ ප්‍රාථමික යකඩ යුගයේ ඉපැරණි මහාශිලා සුසාන ආශ්‍රිතව මේ බඳුන් බහුලව ලැබේ (Bandara 1996). පුරාවිද්‍යාඥයන් විසින් හඳුනා ගනු ලැබ ඇති ආකාරයට මෙම කාල රක්ත වර්ණ මැටි බඳුන් ආසන්න ලෙස ක්‍රි. පූ. 1000 සිට පරිහරණය වී යැයි කියනු ලැබේ. ලංකාවේ මෙම බඳුන් හමුවන සංස්කෘතියේ මුල්ම සමය ප්‍රාථමික යකඩ යුගයේ මහාශිලා සොහොන් සංස්කෘතියට සම්බන්ධකම් දක්වන කාල පරිච්ඡේදයට අයත් බව පොදු පිළිගැනීමය. රිදියගමින් ලැබෙන එම ලක්ෂණ සහිත මැටි බඳුන් කැබලි ද එකී සංස්කෘතියට සම්බන්ධකම් දක්වන්නේ නම් මෙහි ඉතිහාසය අඩු තරමින් ක්‍රි. පූ. තුන්වැනි සියවසට ආසන්න විය හැකි යැයි සාපේක්ෂ වශයෙන් අනුමාන කිරීමට පුළුවන. රිදියගමට සැතපුම් සතරක් පමණ දුරින් වු මහපැලැස්සෙන් මැතක දී වාර්තා වූ මහාශිලා සුසානය (පුරාවිද්‍යා ප්‍රදර්ශණය 1997. පුවරු අංක 03) හා සම්බන්ධයක් ඇතැයි අනුමාන කළ හැකිය.

රිදියගමින් ලැබෙන කාල රක්ත වර්ණ බඳුන් කැබලි මත සටහන්ව ඇති සංකේත පිළිබඳ සලකා බැලීම කාලෝචිතය. මේ ආකාර සලකුණු (Begly 1984, 85) අක්ෂර රටාවක් ලෙස හඳුනාගෙන නැතත් පූර්ව බ්‍රාහ්මී අක්ෂර භාවිතයට පෙර භාවිත වු බව පිළිගනු ලබයි. මෙබඳු සංකේත මහාශිලා සුසානවලින් හමුවන කාල රක්ත වර්ණ මැටි බඳුන් මත සටහන්ව තිබී හඳුනාගෙන ඇත (Deraniyagala 1970, 122). දැනට ලංකාවේ


පැරණිතම බ්‍රාහ්මී අක්ෂර වශයෙන් සැලකෙන ක්‍රි. පූ. 400 පමණ දක්වා කාල නිර්ණයක් දක්වෙන පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත මැටි බඳුන් කැබැල්ලක් අනුරාධපුර ඇතුළු නගරයේ කැණීම් මගින් හඳුනාගෙන තිබේ (Lal 1960, 4-19). දූරණියගල මහතා දක්වන එකී බඳුන් කැබැල්ලෙහි අක්ෂර නොවන සලකුණක් ද සටහන්ව ඇත. මෙය වේදිය සහිත ස්වස්තිකයේ පහල කොටසට සමානය. ඒ ආකාර සලකුණු රිදියගමින් ලැබෙන මැටි මෙවලම් කැබලි මතද දක්නා ලැබේ. බඳුන් පිළිස්සීමෙන් අනතුරුව තබන ලද මෙම සටහන් කුමන අදහසක් සන්නිවේදනය කළේද යන්න පැහැදිලි නොවේ. යාපහුව පින්වැව මහාශිලා සුසානයේ පියන් ගල් මත සටහන් කර ඇති අක්ෂර නොවන සංකේත ගණනාවක් ම වාර්තා විය (සේනානායක 1997). අංක 01-06 ආශ්‍රිත සංකේත බලන්න.


ඉන්දියාවේ පැරණි මැටි බඳුන් සමහර ඒවායෙහි අක්ෂර නොවන සංකේත බහුලව දක්නා ලැබේ (Parker 1984, 474). ඒවාද වැඩි ප්‍රමාණයක් කාල රක්ත වර්ණ බඳුන්වලට අයත් වන බව පෙනේ. ලංකාව තුළින් හමුවන මෙම සංකේත විශේෂ යුගයක් නියෝජනය වන්නේ නම් දැනට කෙරී ඇති පර්යේෂණ සමග සැසඳීමෙන් රිදියගමින් ලැබෙන එකී ලක්ෂණ සහිත මැටි බඳුන් කැබලි ඓතිහාසික වශයෙන් වැදගත් වනු ඇත. මෙම සලකුණු අතරින් කීපයක් පැහැදිලි රූපසටහන් ලෙසින් හඳුනා ගැනීමට පුළුවන. (අංක 01-06 ආශ්‍රිත සටහන් බලන්න)

ඒවායේ ස්වස්තික ලකුණු සහ ඔරුවක සටහන දක්වෙන රූප කීපයක්ම වේ. ස්වස්තික ලකුණු ආකාර කීපයකින්ම යුක්ත වීමක් ද දක්නා ලැබේ. ලංකාව තුළ පැරණිම ස්වස්තික සලකුණු හමුවන්නේ පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හා මෙවැනි මැටි බඳුන් කැබලි මගිනි. ලංකාවේ පැරණි කාසි මතද ස්වස්තික දක්නට ලැබේ (Parker 1994, 474). රිදියගමින් හමුවන මැටි බඳුන් කැබලි මත දැක්වෙන ඇතැම් ස්වස්තික ලකුණු දැනට ප්‍රචලිත ස්වස්තිකයට වඩා වෙනස් හැඩයක් ගන්නා බවක් ද දක්නට ඇත (1-2 සටහන බලන්න). ඔරුවක සලකුණ දැක්වෙන රූපසටහන් කීපයක්ම මෙකී සලකුණු අතර ඇති බව පෙනී යයි. සමහර ඒවායෙහි කුඹගස දැක්වෙන ලක්ෂණ සහිතය. (ඔරුවක සළකුණ දැක්වෙන පැරණි සංකේතයක් දුවේගල පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනයේද දැක්වේ) (Paranavitana 1970, 270).


මෙම සළකුණට සමාන සංකේතයක් රිදියගමින් ලැබුණු කාල රක්ත වර්ණ බඳුන් කැබැල්ලක සටහන්ව තිබිණි. සලකුණු සමග පූර්ව බ්‍රහ්මී අක්ෂර කීපයක්ද රිදියගමින් ලැබී ඇති අතර ඒවා කියවා ගත නොහැකි තනි අකුරුවලට අයත්වේ. ඒ අතර ම, න, ක, න යන අක්ෂර දක්නට ඇත. සටහන් සහිත හා රහිත භාණ්ඩ දෙකකින් යුක්ත වන කාල රක්ත වර්ණ මැටි බඳුන් ඉතා පැරණි බව පොදු පිළිගැනීමයි. ඉන්දියාවේ හා ලංකාවේ ඉපැරණි පුරාවිද්‍යාස්ථාන රාශියකින්ම හමුවී ඇති සහ දැනටත් හමුවෙමින් පවතින මෙම බඳුන් විශේෂය පිළිබඳ පුරාවිද්‍යාඥයන් විසින් පර්යේෂණ පවත්වා ගෙන යනු ලැබේ. මේවායෙහි විශේෂ ලක්ෂණ වන්නේ ඇතුළත තද කළු පැහැ වීමත් පිටත තද රතු පැහැවීමත්ය. විශේෂ ප්‍රගුණතාවයක් ඇති ශිල්ප තාක්ෂණයක් අනුව මෙම බඳුන් වර්ගය සකසා ඇතිබව පෙනී යයි. සාමාන්‍යයෙන් මැටි භාජනවල පිට පැත්ත කළුවීම ස්වාභාවයයි. එහෙත් මෙම වර්ගයේ බඳුන් ඇතුළත දිලිසෙන හා තද කළු පැහැයෙන් යුක්ත වීම සඳහා පිළිස්සීමේ ක්‍රමය හොඳින් ප්‍රගුණකර ගන්නට ඇතැයි සිතීමට පුළුවන. එමෙන්ම මෙකී බඳුන් ආහාර පිසීම වෙනුවෙන් සැකසූ ඒවා නොව වෙනත් පරිහරණයන් සඳහා සැකසූ ඒවා බව සිතීමට පුළුවන. වර්තමාන ව්‍යවහාරයට අනුව මෙම බඳුන් පාත්‍රා, දීසි, කෝප්ප, තැටි, ඇතිලි යනාදියට අයත් සේ වෙන්කිරීමට පුළුවනි. මේ බඳුන් වර්ගය දිවයිනේ ඉතා සීමිත ස්ථාන කීපයකින් ලැබීමත්, ඒවා පැරණි අවධියක් නියෝජනය කිරීමත් යන කරුණු අනුව රිදීයගමින් ලැබෙන එම ලක්ෂණ සහිත බඳුන් සාධක ඉතා පුරාණ යුගයකට අයත් ඒවා සේ සාපේක්ෂ වශයෙන් සැලකීමට පුළුවනි. එහෙයින් රිදියගම ආශ්‍රිත කලාපයේ ඉපැරණි ජනාවාස පවතින්නට ඇති බවට මේවා සාධක වනු ඇත. ස්ථානයක් නිශ්චිත වශයෙන් හඳුනා ගත නොහැකි වුවත් පුරාතන රෝහණයේ මැටි මෙවලම් කර්මාන්තයෙහි නියැලුණු කුඹලුන් හා එම කර්මාන්තය පිළිබඳව සීහල වත්තුප්පකරණයේ සඳහන් වේ (සී. ව. 15).

පසුගිය වසරකදී ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ප්‍රංශ පුරාවිද්‍යා ආයතනයක් එක්ව රිදියගම සිදුකළ පර්යේෂණයකින් පැරණි ලෝහ උණු කිරීමේ ශිල්ප ක්‍රම හා සාධක හඳුනා ගැනීමක් වාර්තා විය. මෙම හඳුනාගැනීම උක්ත ප්‍රදේශයේ ඓතිහාසිකත්වය නව පරිච්ඡේදයක් කරා ගෙන යයි. පුරාවිද්‍යාත්මක සාධක සනාථ කරගැනීමේ ලිඛිත තොරතුරු රෝහණය හා සම්බන්ධව ඇත්දැයි විමසා බැලීම වටී. මෙම මූලාශ්‍රයන් රචනා වූ කාලසීමාවන් පිළිබඳ සමහර ගැටළු ඇතත් ඓතිහාසික වශයෙන් මෙම මූලාශ්‍ර වැදගත් කමක් දරනු ඇත. එමෙන්ම නාමමාත්‍රිකව ස්ථානයන් පැහැදිලි නොවීම එක් ආකාරයක අඩුවකි. එහෙයින් පොදුවේ රෝහණය පිළිබඳව කියැවෙන ලිඛිත සාධක තරමක් විමසා බැලීමෙන් මෙම කලාපයේ ඉපැරණි කර්මාන්ත


1
(B.R.W.)
1996.


2
(BRW)
1996

⑤



ශ්‍රී ලංකාවේ පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන තුළ ඇති අක්ෂර නොවන සංකේත ( S. Paranavithana, 1970 )

⑥



දකුණු ඉන්දියාවේ මෙගලිතික සුසාන ආශ්‍රිත මැටි බඳුන් මත (B.R.W) තිබී හමුවූ සංකේත ( S.K. Ramachandran).

පිළිබඳ යම් අදහසක් ලබාගැනීමට පුළුවන. කාවන්තිස්ස රජු මාගම යුධ අවි කර්මාන්ත ශාලාවක් පිහිටවූ බව සද්ධර්මාලංකාරයේ සඳහන්වේ. සද්ධාතිස්ස රජු සමයේදී රුහුණු දනව්වේ රන්කරුවෙක් විසීය (එම). ක්‍රි. ව. 1647 දී පමණ රචනා වී ඇති සාහිත්‍යය මූලාශ්‍රයක දිවයිනේ විවිධ වූ ගම් අතුරින් ලෝහ කර්මාන්තය පැවති ගම් කිහිපයක් ගැන කියවේ (එම). එම කෘතියට අනුව රිදිගම් 16ක්, රන්උපදනා ගම් 1000ක්, කඹුරු නැකති ගම් 1000ක්, පට්ටල් ගම් 64ක්, කම්මල් 2000ක් හා වඩු ගම් 500ක් ගැන කියවේ. මේවායෙහි සංඛ්‍යාවල අතිශයෝක්තියක් ඇත්ද නැතිද යන්න කෙසේ වෙතත් ආසන්න වශයෙන් උක්ත කර්මාන්තය හා සම්බන්ධ කරුණු අන්තර්ගත වීම වැදගත්ය. මෙහි විශේෂ වැදගත්කම වන්නේ ප්‍රදේශ නාම වශයෙන් හඳුනාගැනීමට ඇති හැකියාවයි.

හම්බන්තොට ගිරවා ඌවදෙදුම්බර බිම්තැන් නා
සබරගමුව සහ සත්කෝරල මන්නාරම තිබෙ නා
යකඩ ලෝහෝ කම්මල් එකසිය සත්තෑ පමණවෙ නා
කරවා දහස් ගණන් නිරතුරු දෙන නෙක වැඩ කර නා
(මන්දරම් පුවත, 152 කවිය)

මෙම කවියට අනුව ස්ථාන පමණක් නොව කම්මල් ප්‍රමාණය හා විවිධ කටයුතු සිදුකර ඇති බවත් හෙළි වෙයි. උක්ත කවිය අයත් වන්නේ විමලධර්මසූරිය රජුගේ විස්තර දැක්වීමේදී ය. රාජසිංහ රජුගේ විස්තර දැක්වෙන මෙම කාව්‍ය ග්‍රන්ථයෙහිම මෙසේ දැක්වේ.

නුවර කලාවිය ගිරවා වන්නිය වල් බිහි කටුකොහොලුත් හර වා
දෙතිස් වැව් සහ සතලිස් කෙත් වතු උයන්ද තැන තැන ඇති කර වා
මැණික් රුවන් ආකර සහ යකඩද උපදින තැන ඇති ලෙස කර වා
කම්මල් පට්ටල් සමගින සිත්කම් කරනා තැන් එම ලෙස කර වා
(මන්දරම් පුවත, 383 කවිය)

උක්ත කවිවලින් කියවෙන තොරතුරු අනුව හම්බන්තොට ප්‍රදේශයේ මහනුවර සමයේදී ලෝහ කර්මාන්තය පැවති බව හෙළිවේ. මුලින් දක්වන ලද රිදියගම ලෝහ කර්මාන්තය පිළිබඳ නව සොයාගැනීමට අදාල කාලනිර්ණයක් මෙතෙක් අනාවර්ණය වී නොමැත. මෙම ප්‍රදේශය තුළින් හමුවන ලෝහ කර්මාන්තයට අයත් තොරතුරු පැරණි රෝහණයේ තාක්ෂණික සහ ශිල්ප ක්‍රම පෙන්නුම් කෙරෙන ඓතිහාසික සාධක සේ අගය කිරීම වටී. එපමණක් නොව අනෙකුත් පුරාවස්තූන්ගෙන් හෙළිවන කරුණු අනුව කාලාන්තරයක් තිස්සේ පැවති සමාජ ආර්ථික රටාවක තොරතුරු මේ ආශ්‍රිත කලාපයේ පසින් යටව ඇතැයි කීමට සහේතුක කරුණු ඇත. දිවයිනේ ඉපැරණි ජනාවාස රටාවේ ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු ප්‍රමාණයක් ද මේ ආකාරයෙන් ලැබෙන්නාවූ නව පුරාවිද්‍යාත්මක සාධක අනුව පැහැදිළි වනු ඇත. රෝහණයේ පුරාතණ ජනාවාස පිහිටි බවට සාධක ඇති රිදියගම, නව ජනපද පිහිටුවීම සඳහා මූලික පසුබිමක් සේ සලකා ඇත්තේ වාරිකර්මාන්ත පදනම් කරගත් කෘෂිඅර්ථ ක්‍රමයයි. එමෙන්ම අම්බලන්තොට බැරගම නව ජනපදය සඳහා පසුබිම් ව ඇත්තේ ද එම කරුණමය. පැරණි ජනාවාස බොහොමයක් කෙරෙහි පදනම් ව ඇත්තේ ද මේ ආකාර වාරි තාක්ෂණය මත පෝෂණය ලැබූ සමාජ ක්‍රමයක් බව කලාපයේ පවතින පැරණි වැව් අනුව සලකා බැලීමට පුළුවන. එවැනි සමාජ රටාවකට අනුබද්ධිත අනිකුත් නිපැයුම් වෙළඳ රටාවකට යොමු වූ පසුබිමක් මෙකී භෞතික ක්ෂේත්‍රය තුළ පවතින්නට ඇතැයි කීමට සාධක පවතී. මේ අනුව අතීතයේදීත් වර්තමානයේදීත් ජනාවාස පිහිටුවා ගැනීම කෙරෙහි පාරසරික තත්වය කුමන ආකාරයෙන් බලපානු ලැබ ඇත්දැයි පැහැදිලි වනු ඇත. පුරාණ රෝහණයේ මෙතෙක් අනාවරණය නොවුනු ඓතිහාසික තොරතුරු ඉදිරියේ දී තව දුරටත් හෙළිවනු ඇත. ඒ අනුව විශේෂයෙන්ම දැනට ඉතිහාසයට එක්ව ඇති දේශපාලන ඉතිහාසයට අමතරව සමාජ ආර්ථික රටාවේ වෙනත් තොරතුරු හෙළිවනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. මහාවංසය 1959. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ.

2. වංසත්තප්පකාසිනි 1994. අකුරටියේ අමරවංශ සහ හේමචන්ද්‍ර දිසානායක සංස්කරණය,කැළණිය පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලය.

3. සීහළ වත්ථුපකරණං 1959. ධම්මනන්දිතෙර, පොල්වත්තේ බුද්ධදත්ත සංස්කරණය, අනුලා මුද්‍රණාලය.

4. මන්දාරම් පුවත 1996. ලබුගම ලංකානන්ද සංස්කරණය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

5. මානාවුළු සන්දේශය 1982. ඇත්තුඩාවේ රාහුල හිමි සංස්කරණය, ගලප්පත්ති මුද්‍රණාලය, බෙලිඅත්ත.

6. Inscription of Ceylon, Vol. 01. 1970. Paranavitana, S. , Archaeological Survey Department of Ceylon. Colombo.

7. ආරියපාල, ඇම්. බී. 1962. මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය, රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව, කොළඹ.

8. Begly, Wimala, 1981. Journal of Archaeological Survey Department of Sri Lanka, Ancient Ceylon, No. 04

9. බෝපේආරච්චි, ඔ, 1994 ඔක්. 08, කාසියේ ප්‍රභවය සහ පරිනාමය පිළිබඳ වැඩමුළුව, රාජ්‍ය ලේඛනාගාරය, කොළඹ.

10. Bopearchchi O. and Wickramasinghe, R., 1997 Aug. 6th, Coins, beads, mould and seal, Archaeology and Meritime trade, Seminar, Department of Archaeology, University of Peradeniya.

11. Bopearchchi, O. 1997 Aug. 6th, New evidence on Iron Smelting and glass beads marking tecnology of Sri Lanka : results of Sri Lankan-French Excavation at Ridiyagama, University of Peradeniya.

12. Bopearachchi,Q. 1996 Sep. 6th,Seminar Prsentation at IFS.

13. බ්‍රොහියර්, ආර්. ඇල් 1935. ලංකාවේ පුරාතන වාරික්‍රම, III කොටස, රාජ්‍ය මුද්‍රණ සංස්ථාව, කොළඹ.

14. Deraniyagala, S.U. 1970 Journal of the Archaeological Survey Department of Sri Lanka,(Ancient Ceylon No. 05)

15. Bandara , Y.K.T 1997. Classification of Pottery from the Pinwewa Galsohonkanatta, Seminar Presentation, Department of Archaeology, University of Peradeniya.

16. Bandaranayake, S.and Mats, M. 1994. Settelment Archaeology of the Sigiriya Dambulla region, The Postgraduate Institute of Archaeology, University of Kelaniya.

17. Jayasinghe, C. 1996 Sep. 22nd, New discovery of inscribed coins from Akurugoda, Tissamaharamaya,The Island news paper.

18. Lal,B.B. 1960. From the Megalithic Harappa tracing book The graffit; on the pottery, Anciant india.

19. Parker,H. 1984. Ancient Ceylon,(Second ed) New Delhi.

20. පොන්නම්පෙරුම, රෝහණ 1969. විදේශීන් දුටු පුරාණ ලංකාව (II සංස්කරණය).

21. Senaviratna, S. 1984. The Archaeology of the Megalithic Black and Red Ware Complex in Sri Lanka. Ancient Ceylon No. 5, Journal of the Archaeological Survey Department of Sri Lanaka.

22. සේනානායක, පියතිස්ස 1997 දෙසැම්. 04, පිංවැව ගල්සොහොන් කනත්ත ආශ්‍රිත සංකේත, පුරාවිද්‍යා සම්මන්ත්‍රණය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

23. Weerakkody, D.P.M. 1995. Roman Coins of Sri Lanka, Seminar Prsentation, Department of Archaeology, University of Peradeniya.

24. "දකුණේ පුරාවිද්‍යා නව සොයාගැනීම්" බිත්ති පුවත්පත පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 1996.

25. ශ්‍රී ලංකාවේ මහාශිලා සුසානවල ව්‍යාප්තිය දැක්වෙන සිතියම පුරාවිද්‍යා ප්‍රදර්ශනය, පුවරු අංක 03, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, 1997 දෙසැම්බර් 4 හා 5.

26. ලියුම්කරු, 1996 දි ඉන්දියාවේ කරන ලද සංචාරයකින් පුරාවිද්‍යා කෞතුකාගාර කීපයක ඇති මැටිබඳුන් පරීක්ෂාකර බලා ලබාගත් තොරතුරු අනුවයි.